# <u>දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>

## <u>දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම</u>

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීමට,දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

*01. සුදුසුකම්:*

- I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ වසර 05කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු ය.
- II. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට වයස අවුරුදු 58 ට නොවැඩි විය යුතු ය.
- III. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු අතර, වාර්ෂික වැටුප් වර්ධක සියල්ල උපයාගෙන සතුටුදායක හෝ ඉන් ඉහළ කාර්යසාධන මට්ටමක් අත්කරගෙන තිබිය යුතු ය.
- IV. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ විනය කටයුත්තකට හෝ විනය දඬුවමකට භාජනය නොවූ අයෙකු විය යුතු ය.

*02. තෝරා ගැනීමේ ක්‍රමය:*

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

*03. අයදුම්පත් ඉදිරිපත් කිරීම:*

- මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්කරුවන් විසින් සකස් කරනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතු වේ. ආයතන ප්‍රධානීන් විසින් තමන්ට ලැබෙන අයදුම්පත් වල සඳහන් කරුණු අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු වල ඇතුළත් වාර්තා සමඟ සසඳා බලා නිරවද්‍යතාවය පිළිබඳ සෑහීමකට පත් වීමෙන් අනතුරුව සහතික කළ යුතුය.

- සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර **2022.12.26** වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මඟින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව) **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, 6 වන මහල, ගාල්ල"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය.

- අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර සතුවේ.

මෙයට,

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දකුණු පළාත.

2022.12.16